K. ඈන් අකිලා

*අනුන් විනිශ්චය කිරීම*
*(ලූක් 6:37-38 41-42)*
*7 විනිශ්චය නොකරන්නන එවිට ඔබ ද විනිශ්චය කරනු නොලබන්නෙහිය. 2ඔබ දෙන විනිශ්චයයෙන්ම ඔබත් විනිශ්චය කරනු ලබන්නෙහිය. ඔබ මනින මිම්මෙන්ම ඔබටත් මැන දෙනු ලැබේ. 3ඔබේ ම ඇසේ ඇති කොටය ගැන නොතකා ඔබේ සහෝදරයාගේ ඇසේ ඇති ලී කුඩ ගැන බලන්නේ මන්ද? 4නොහොත් ඔබේම ඇසෙහි ලී කොටය තිබියදී, සහෝදරයාට කතා කොට, ඔබේ ඇසේ තිබෙන ලී කුඩ පහ කරන්න ඉඩ දෙන්නැ යි ඔහුට කියන්නේ කොහොමද? 5කෙරාටිකය, පළමු කොට ඔබේ ඇසෙන් ලී කොටය පහ කරන්නන එවිට සහෝදරයාගේ ඇසෙන් ලී කුඩ පහ කරන්න ඔබට හොඳින් පෙනෙනු ඇත.*
*6 පූජනීය දේ බල්ලන්ට නොදෙන්න. ඔබේ මුතු ඇට ඌරන් ඉදිරියෙහි නොදමන්න. එසේ කළොත්, උන් ඒවා පයින් පාගාදමා හැරී අවුත් ඔබ කැබලි කොට ඉරාදමනු ඇත.*

**<u>මතෙව් 7</u>**

**<u>අනුන් විනිශ්චය කිරීම</u>**

ශු.බයිබලයේ මතෙව් සුවිශේෂයේ හත්වන පරිච්ඡේදයේ සඳහන් වෙනවා අපි යම් පුද්ගලයෙකුව හරි යම් දෙයක් ගැන හරි විනිශ්චය නොකරනවනම් අපවද විනිශ්චය නොකරනු ලබයි කියලා.අපි දෙන විනිශ්චයෙන්ම තමයි කවද හරි අපවද විනිශ්චය කරනු ලබන්නේ සහ අපි අනිත් අයව මනින මිම්මෙන්ම තමයි අපවත් මනිනු ලබන්නේ කියලා.අපේ වැරදි තිබියදී අපි අපේ සහෝදරයාගේ වැරදි සොයන්නේ ඇයි?අපි ළඟ ඇති වැරදි අඩුපාඩුකම් හදා ගන්නේ නැතිව අපේ සහෝදරයා ළඟ ඇති වැරදි නිවැරදි කරන්නේ කොහොමද?පළමුවෙන්ම අපි අපේ වැරදි අඩුපාඩුකම් නිවැරදි කරගත්තාට පසු අපට අපේ සහෝදරයාගේ වැරදි නිවැරදි කිරීමට හැකිවේ.අපේ හොඳ ගතිගුණ නැති කරගෙන පහත් තත්වයට ඇද වැටීමෙන් වැළකිය යුතුය.නරක පුද්ගලයන් ආශ්‍රය කිරීමෙන් අපිත් ඒ තත්වයටම පත් නොවී ඒ නරක පුද්ගලයින්වත් හොඳ මිනිසුන් කිරීමට උත්සහ කල යුතුයි.නැතිනම් කවදා හෝ ඒ නරක ගතිගුණ හා අප ඇසුරු කරන අයහපත් පුද්ගලයන් නිසා අපිට විනාශ වීමට සිදු වේ.

මේ පරිච්ඡේදයේ සඳහන් වන දෑ අද ලංකාවේ ඇති වී ඇති තත්වය සමඟ සසඳා බලමු.පළමු කරුණෙහි සඳහන් ආකාරයට අද සමාජයේ සිටින මිනිසුන් වැඩි වශයෙන්ම කරන්නේ අනුන්ව විනිශ්චය කිරීමයි.උදාහරණයක් වශයෙන් අද සමාජයේ ප්‍රසිද්ධ පුද්ගලයින්ව විශාල ලෙස විනිශ්චය කරනු ලබනවා.ඔවුන්ගේ සේවය ගැන,ඔවුන්ගේ චරිතය ගැන මිනිසුන් වැඩි වශයෙන් විනිශ්චය කරනවා.අනෙක මිනිසුන් සමාජයේ පුද්ගලයින්ව මනිනු ලබන්නේ ඔවුන්ගේ තරාතිරම,කුලය ගැන සළකලයි.මිල මුදල් යහමින් තිබෙන සමාජයේ ඉහළ මට්ටමේ සිටින පුද්ගලයන්ව ඔවුන් වැඩි වැඩියෙන් ආශ්‍රය කරනවා.ඒ වගේම අඩු ආදායම් ලබන සමාජයේ පහළ මට්ටමේ සිටින පුද්ගලයන්ව ඔවුන් ආශ්‍රයෙන් ඈත් කර තබනවා.ඔවුන්ව කොන් කරනවා.අපේ රටේ වැඩි වශයෙන් දක්නට ලැබෙන කරුණකි අන් අයගේ වැරදි අඩුපාඩු ගැන නිතර නිතර සෙවීම.අපේ වැරදි නිවැරදි කරගන්නේ නැතිව අන් අයගේ වැරදි නිවැරදි කිරීමට යෑම.උදාහරණයක් ලෙස සමහර දෙමව්පියන් තමන්ගේ දරුවන්ගේ කොතෙකුත් වැරදි තිබුණත් ඒ ගැන සොයාබලන්නේ නැතිව අනෙක් දරුවන්ගේ වැරදි ගැන සොයමින් ඒවා නිවැරදි කිරීමට යාම.ලංකාවේ සමහර මිනිසුන් නරක පුද්ගලයින් හොඳ මගට හරවා ගැනීමට ගොස් ඔවුන්ද ඒ තත්වයටම පත් වී ඒ නරක මිනිසුන් හා නරක පුරුදු නිසා විනාශයට පත්වෙච්ච අවස්ථා අප්‍රමාණයි.උදාහරණ ලෙස මත්පැනට,මත් කුඩුවලට,නිල් චිත්‍රපට සහ සල්ලාලකමට ඇබ්බැහිවුවන් එයින් මුදාගැනීමට යන සමහර පුද්ගලයින්ද ඒවාටම ඇබ්බැහි වන අවස්ථා දැක්විය හැක.දැලි පිහියෙන් කිරි කන්නා සේ නරක පුද්ගලයන්ව හරි මාර්ගයට හරවා ගනිමින් අපත් හොඳ පුද්ගලයන් ලෙස ජීවත් වීමට අපි වගබලාගත යුතුය.

තවද මෙම පරිච්ඡේදයේ "පූජනීය දේ බල්ලන්ට නොදෙන්න.ඔබේ මුතු ඇට ඌරන් ඉදිරියෙහි නොදමන්න.එසේ කලොත්,උන් ඒවා පයින් පාගා දමා හැරී අවුත් ඔබ කැබලි කොට ඉරා දමනු ඇත."යනුවෙන්ද සඳහන් වෙනවා.මෙයින් අදහස් වන දෙය අපි සොයා බලමු.මිනිසා කියන්නෙ සතෙක් නෙවෙයි.මිනිසා යනු ඉතා උසස් පුද්ගලයෙක්.නමුත් මිනිසාට විටෙක සත්ත්ව ගණයට වැටෙන්න හැකියාව තිබෙනවා.ඒ මිනිසා කරනු ලබන

ක්‍රියාවන් මගින්.ඉතිං මේ කියමනෙන් අදහස් වන්නේ සත්ත්ව ගණයට වැටුණු මිනිහෙකුට මොනතරම් වටිනා දෙයක් තේරුම් කරල දෙන්න ගියත් ඔහුට එය තේරුම් ගැනීමට හැකියාවක් නැහැ,තේරුම් ගැනීමට අවශ්‍යතාවයකුත් නැහැ කියන දෙයයි.අපි මොනතරම් ඔහුට ඒ දේ තේරුම් කර දුන්නත් ඔහු එය තේරුම් ගැනීමට පෙළඹෙන්නේ නැහැ.ඔහු සිටින්නේ ඔහුගේ මතය නිවැරදියි යන ආකල්පයෙනි.එම නිසා ඒ අවස්ථාවේදී මොනතරම් වැදගත් දෙයක් ඔහුට තේරුම් කර දීමට ගියත් එයින් අපට යහපත් ප්‍රතිඵල බලාපොරොත්තු වීමට හැකිවන්නේ නැත.උදාහරණයක් ලෙස අපි බලමු මිනිසෙකු සත්ව ගණයට පත්වන අවස්ථා.පමණට වඩා මත්පැන් පානය කර සිටින අවස්ථාවකදී මිනිසෙකු සතෙකු බවට පත්විය හැකියි.මිනිසා විසින් මිනිමැරුමක් සිදු කරන විට එහිදීද මිනිසා සතෙක් බවට පත්වේ.මා සඳහන් කල පළමු උදාහරණයට අනුව මිනිසෙකු මත්පැන් පමණට වඩා පානය කර සත්ත්ව ගණයට පත්වී සිටින විටෙකදී ඔහුට මිනිසා සතෙක් නොවෙයි යන කාරණය පහදා දීමට යාමේදී බොහෝ බාධක පැමිණීමට ඉඩ තිබේ.ඔබ "මිනිසා සතෙක් නොවෙයි"කියද්දී ඔහු "නැහැ මිනිසා සතෙක් තමයි"යනුවෙන් පැවසීමට පුළුවන.ඔබ "මිනිසා සතෙක් නොවෙයි,නමුත් මිනිසාට සතෙක් වීමට පුළුවන්"යනුවෙන් කියද්දී ඔහු "නැහැ ඒක වෙන්න බැහැ මිනිසා සතෙක් තමයි"යනුවෙන් කීමට පුළුවන.ඔහු කොහෙත්ම මිනිසා සතෙක් නොවෙයි කියන දෙය පිළිගන්න පුළුවන් මානසිකත්වයකත් නෙවෙයි ඉන්නේ.මොකද ඔහුත් ඒ වන විට සත්ත්ව ගණයට වැටී හමාර නිසා.මේ තත්වය මත ඔබ දිගින් දිගටම මේ කාරණය ඔහුට තේරුම් කරන්න ගියොත් වෙන්නෙ එය රණ්ඩුවක් බවට පරිවර්තනය වීමයි.එසේ වීමට පෙර අපි එය වළක්වා ගත යුතුයි.හොඳම දේ ඒ අවස්ථාවේදී ඔහුගේ මතයට ඉඩදී අපි නිහඬව සිටීමයි.පසුව ඔහු හොඳ මානසිකත්වයකින් සිටින අවස්ථාවකදී ඔහුට මෙය පහදා දීමට උත්සාහ කිරීමයි.මෙසේ මොළය පාවිච්චි කර ක්‍රියා කිරීමෙන් එම පුද්ගලයා සමග රණ්ඩුවකට පැටලී ඔබත් සත්ත්වයෙකු බවට පත්වීමෙන් වැළකී සිටීමට ඔබට හැකියාව ලැබේ.

K. ඈන් අකිලා ප්‍රනාන්දු

ආවේ මරියා බාලිකා විදුහල - මීගමුව

9 ශ්‍රේණිය

පිටිපන වීදිය දහම් පාසල - දුව මීසම